www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මැතිවරනය: දෙමල ජනතාව ඡන්දය දීමෙන් වලකාලීමේ කුමන්ත්‍රනයක්

## Sri Lankan elections: a conspiracy to prevent Tamils from voting

**දීපාල් ජයසේකර විසිනි**
**2005 නොවැම්බර් 15**

ශ්‍රී ලංකාවේ දේශපාලනයේ වාර්ගිකව ආරෝපිත වාතාවරනය තුල, නොවැම්බර් 17 දා පැවැත්වෙන ජනාධිපතිවරනයේ දී යුද්ධයෙන් විනාශ වූ උතුරු හා නැගෙනහිර පලාත්වල වෙසෙන දෙමල ජනතාව විශාල සංඛ්‍යාවක් ඡන්දය දීමෙන් වලකාලීමේ කුමන්ත්‍රනයක් දිග හැරෙමින් පවතී. කොලඹ ආන්ඩුව සහ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය -- එකිනෙකා තම තමන්ගේ දේශපාලන අරමුනු වෙනුවෙන් --, සිදුවීමට ඉඩකඩ අඩු ආකාරයේ සන්ධානයකට බැඳෙමින්, දෙමල ඡන්දදායකයන් ඡන්දය දීමට ඇති සිය මූලික අයිතිය ක්‍රියාවට දැමීම වලකාලීමේ ප්‍රයත්නයක යෙදී සිටිති.

නොවැම්බර් 9 දා, ශ්‍රේෂ්ඨාධිකරනය, කැරලිකාර එල්ටීටීඊය විසින් පාලනය කරනු ලබන ප්‍රදේශවල දෙමල ජනතාවට ඡන්දය දීමට ඇති අයිතීන් මත බරපතල සීමා පනවන තීන්දුවක් ප්‍රකාශය පත් කලේ ය. එල්ටීටීඊ පාලන ප්‍රදේශ ඇතුලත කිසිදු ඡන්ද මධ්‍යස්ථානයක් නොපිහිටුවන බව ද ඡන්දදායකයන්ට හමුදා පාලන කලාප ඇතුලත පිහිටි "පොකුරු" ඡන්ද මධ්‍යස්ථාන කරා ගමන් කිරීමට බල කෙරෙන බවත් එම තීන්දුව මගින් තහවුරු කෙරුනි. මෙම අවශ්‍යතාව සිය ඡන්දය පාවිච්චි කිරීමේ දී ඡන්දදායකයන් ජය ගත යුතු බාධා මාලාවෙන් එකක් පමනි.

ශ්‍රේෂ්ඨාධිකරන තීන්දුව දෙන ලද්දේ, ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුනේ (ශ්‍රීලප්‍රපෙ) සහ ශ්‍රී ලංකා ජාතික පෙරමුනේ (ශ්‍රීලජාපෙ) ජනාධිපති අපේක්ෂකයන් විසින් ගොනු කරන ලද "මූලික අයිතිවාසිකම්" පෙත්සමකට ප්‍රතිචාර වසයෙනි. ශ්‍රීලප්‍රපෙ පාලක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) වෙනුවෙන් ක්‍රියා කරන පෙරමුනකි. එහි මාධ්‍ය කාලය සහ ඡන්ද සියල්ල යන්නේ ශ්‍රීලනිප අපේක්ෂක අගමැති මහින්ද රාජපක්ෂට ය.

දෙමල ජනතාව විශාල වසයෙන් තම විරුද්ධවාදියා වන එක්සත් ජාතික පක්ෂයේ (එජාප) අපේක්ෂක රනිල් වික්‍රමසිංහට ඡන්දය දෙනු ඇතැයි රාජපක්ෂ ගනන් බලන බැවින් හැකි තරම් දෙමල ඡන්දදායකයන් සංඛ්‍යාවකගේ ඡන්ද අයිතිය අහිමි කිරීමට ඔහු උනන්දු ය. වික්‍රමසිංහ "සාම ක්‍රියාදාමය" යලි ඇරඹීමට තල්ලුව දී ඇති අතර, රාජපක්ෂ, යුද්ධය යලි ඇවිලීමේ තර්ජනය මතු කරන ඉල්ලීම් මාලාවක් එල්ටීටීඊයට යොමු කර ඇති සිංහල ස්වෝත්තමවාදී පක්ෂ -- ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය -- සමග සන්ධානගත වී සිටී.

පෙත්සම ව්‍යවස්ථාවේ අඩංගු "මූලික අයිතිවාසිකම්" පිලිබඳ වගන්ති විහිලුවට ලක් කරයි. පෙත්සම්කරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම වෙනුවට එහි විවෘත එල්ලය වන්නේ එල්ටීටීඊ පාලන ප්‍රදේශවල වෙසෙන දෙමල ජනයාගේ අයිතීන් අහිමි කිරීම යි. නඩුව ඉදිරියට යද්දී, මැතිවරන කොමසාරිස් නිවේදනය කර සිටියේ, එල්ටීටීඊ පාලන ප්‍රදේශවල ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීමේ කිසිදු අභිප්‍රායක් තමන්ට නැති බව හා ආන්ඩුවේ හා එල්ටීටීඊ ප්‍රදේශ වෙන් කරන "පාලන රේඛාවේ" සිට අඩු ගනනේ මීටර් 500ක් දුරින් ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවන බව යි. ශ්‍රේෂ්ඨාධිකරනය මෙම අවම දුර කිලෝ මීටර් 1 දක්වා දීර්ඝ කලේ ය.

ඡන්දය දීමට අවශ්‍ය ජනයාට දන් බියගැන්වීමේ වධක ක්‍රියාදාමයක් හරහා යාමට සිදු වනු ඇත. විශාල දුරක් ගමන් කිරීමට සිදු වනවාට අමතරව, එල්ටීටීඊය හා ශ්‍රී ලංකා හමුදාව විසින් පවත්වා ගෙන යන සෝදිසි කපොලු හරහා යාමට ඔවුන්ට සිදු වනු ඇත. අතීතයේ දී, -- ඡන්දදායකයන්ට දිග පෝලිම්වල සිටීමට බල කරමින් හා "ආරක්ෂක හේතු" මත ඔවුන් ආපසු හරවා යවමින් --එම ක්‍රියාව හැකි තරම් අසීරු ප්‍රයත්නයක් බවට පත් කිරීමට මිලිටරිය ක්‍රියා කොට ඇත. බොහෝ දෙනෙක් ඡන්දය දීමෙන් වලකාලන ලදි.

ඡන්ද මධ්‍යස්ථානයට යාමට සමත් වුවත් ඡන්දදායකයෝ නව බාධකවලට මුහුන දෙනු ඇත. මැතිවරන කොමසාරිස් විසින් යෝජිත කරුනු 10කින් යුත් ක්‍රියාදාමය යටතේ, ඡන්දදායකයකුගේ ඡන්ද අයිතිය අභියෝගයට ලක් වුව හොත් ඔහු හෝ ඇය නිලධාරින්ගේ ප්‍රශ්න කිරීම්වලට ලක් විය හැකි ය.

ඡන්දදායකයෝ සිය ඡන්දය පාවිච්චි කිරීමෙන් වලකාලීමට පමනක් නො ව නිලධාරින් සෑහීමකට පත් වන ලෙස සිය අනන්‍යතාව ඔප්පු කිරීමට ඔවුන් අසමත් වුව හොත් පොලිස් රඳවා ගැනීම්වලට ද ලක් කල හැකි ය. එල්ටීටීඊ පාලන ප්‍රදේශවල වෙසෙන බොහෝ දෙමල ජනයාට නිල ලේඛන ලබා ගැනීමට ඇති විධික්‍රම මඳකම නිසා මෙම අනන්‍යතාව ඔප්පු කිරීමේ ක්‍රියාදාමය පුලුල් ලෙස අපයෝජනයට ලක් වීමට බෙහෙවින් ඉඩ ඇත. සිය වයස අවුරුදු 18ට වැඩි බව ඔප්පු කිරීමට අසමත් තරුනයෝ විශේෂයෙන් ම ඉලක්ක කෙරෙති.

නොවැම්බර් 10 දා, ශ්‍රේෂ්ඨාධිකරන තීන්දුවට පසු දින, එල්ටීටීඊය සිය පාර්ලිමේන්තු ඒජන්තයන් වන දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ) සමග සිය පාලන ප්‍රදේශය තුල කිලිනොච්චියේ පැවති සාකච්ඡාවේ ප්‍රතිපල නිවේදනය කලේ ය. මතුපිටින් බැලූ කල පෙනී යන්නේ දෙමල ජනතාවට ඡන්දය දිය හැකි යැයි එල්ටීටීඊ-ටීඑන්ඒ ත්‍යාගශීලී ලෙස තීන්දු කර ඇති වගකි. ටීඑන්ඒ පාර්ලිමේන්තු කන්ඩායමේ නායක ආර්. සම්බන්ධන් මාධ්‍යවලට මෙසේ ප්‍රකාශ කලේ යඃ "ටීඑන්ඒ සංවිධානය වත් එල්ටීටීඊය වත් ඡන්දය නො දෙන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ නැත. ඔවුන් සිය ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් පාවිච්චි කිරීමෙන් වලකාලීමට අපි කිසිදු අයුරකින් මැදිහත් නොවෙමු."

ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට පක්ෂපාතී බවට ආකාරගත ලෙස ප්‍රකාශ කිරීම ඉලක්ක කොට ඇත්තේ ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව වෙත ය. සාම සාකච්ඡා යලි ඇරඹීම සඳහා පිටුබලය සැපයීම පිනිස මහ බලවතුන්ගේ සහාය ලබා ගැනීමේ ප්‍රයත්නයේ දී, හිතාමතාම හා විවෘතව ම දෙමල ඡන්දදායකයන්ට බාධා කිරීමක්, තමන්ට විරුද්ධව යොදා ගනු ඇතැයි යන්න පිලිබඳව ටීඑන්ඒ සහ එල්ටීටීඊය උත්සුක වී ඇත. විශේෂයනේ ම අගෝස්තු මස විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනයට ඔවුන් වගකිව යුතු යැයි චෝදනා එල්ල වීමෙන් පසුව යුරෝපීය සංගමය තුල තදබල කොන්දේසිවලට එල්ටීටීඊය මුහුන දී සිටී.

කෙසේ වෙතත්. ආර්. සම්බන්ධන්ගේ දැක්වූ අදහස් මගින් පැහැදිලි වන්නේ එල්ටීටීඊ ඡන්ද වර්ජනයකට කැමති බව යි. "එලඹෙන ශ්‍රී ලංකා ජනාධිපතිවරනය පිලිබඳ යම් උනන්දුවක් දැක්වීම මගින් දෙමල ජනයාට කිසිදු වාසියක් අත් නො වනු ඇත යන්න අපි ඒත්තු ගෙන සිටිමු. . . . දෙමල ජනයා එලඹෙන ජනාධිපතිවරනය ගැන උනන්දුව මුලුමනින් ම නැති කර ගෙන තිබීම පුදුමයට කරුනක් නො වේ." යැයි ඔහු පැවසී ය.

යමක් "ඒත්තු" ගැනීමෙන් අනතුරුව, සිය අදහස් ගැන අන්‍යයන්ට ඒත්තු ගැන්වීම පිනිස දේශපාලන තර්ක මත පදනම් වීමේ හෝ අත් බැඳගෙන සිද්ධීන් දිග හැරීමට ඉඩ දී බලා සිටීමේ පුරුද්දක් එල්ටීටීඊයට නැත. ඒ වෙනුවට, සිය දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිවත් වඩා පුලුල් ලෙස දෙමල ජනතාව බියවැද්දීමත් පිනිස මැර බලය යොදා ගැනීම ගැන එල්ටීටීඊය කුප්‍රකට ය. මැතිවරනය ගැන "උනන්දුව නැති කර" ගන්නා ලෙස උතුරේ හා නැගෙනහිර ඡන්දදායකයන් වෙත කෙරුනු නිසැක තර්ජනය ඉහත නිවේදනයේ අඩංගු වේ. ප්‍රධාන පක්ෂවලින් එකකට හෝ සහයෝගය නො දීමට තීරනය කර ඇති, එල්ටීටීඊය පැහැදිලිව ම තීන්දු කර ඇත්තේ, "දෙමල ජනතාවගේ එක ම නියෝජිතයා" බවට තමන් කරන ප්‍රෝඩාකාරී කියාපෑම බලාත්මක කිරීමේ පහසු ම මග ආවෘත වර්ජනයක් පැනවීම බව යි.

ඔක්තෝබර් 30 දා, මක්කල් පඩෙයි නැත හොත් මහජන හමුදාව යන නමින් තමන්ව හඳුන්වා ගන්නා කලින් නො දන්නා කන්ඩායමක්, සමාජවාදී සමානතා පක්ෂය විසින් රැස්වීමක් සඳහා වෙන් කර ගෙන තිබූ යාපනයේ ශාලාවක වැසූ දොරවල් මත දැන්වීමක් ඇලවී ය. එය ඡන්දය වර්ජනය කරන ලෙස ඉල්ලා සිටි අතර ජනාධිපතිවරනය ප්‍රචාරය කරන කිසිදු කටයුත්තක නො යෙදෙන ලෙස ද එසේ නො වුන හොත් "නිසි පිලිතුරක් දෙන" බවට ද දෙමල ජනයාට අවධාරනය කලේ ය. පනිවිඩය මුලුමනින් ම පැහැදිලි කරනු පිනිස, යතුරු පැදියක නැගි මැරයින් දෙදෙනෙක් රැස්වීම පැවැත්වුව හොත් ශාලාව තුලට බෝම්බයක් දමා ගසන බවට තර්ජනය කලේ ය. කිසිවෙක් මේ සඳහා වගකීම භාර නො ගත්තත්, සිද්ධිය නිසැකව ම එල්ටීටීඊයේ සලකුනු දරන අතර දෙමල ජනයා මැතිවරනය ගැන කිසිදු උනන්දුවක් නො දැක්වීම පිනිස ඔවුන් දක්වන උත්සුකතාව සමග ගැලපෙයි.

එල්ටීටීඊයට අනුබද්ධිත යාපන දිස්ත්‍රික්කයේ උසස් අධ්‍යාපන ආයතනවල ශිෂ්‍ය සංවිධාන විසින් නිකුත් කරන ලද මෑත නිවේදනයක් එජාප සහ ශ්‍රීලනිප අපේක්ෂකයන් දෙදෙනා ම ද්‍රෝහීන් ලෙස හෙලා දැක්කේ ය. එය මැතිවරනය වර්ජනය කරන ලෙස දෙමල ජනයාගෙන් ඉල්ලා සිටි අතර "දෙමල ජනයාගේ භූමිය තව දුරටත් සිංහල නායකයන් විශ්වාස නො කරනු ඇතැයි ජාත්‍යන්තර ප්‍රජාව වෙත නිවේදනය කර සිටී." එල්ටීටීඊයට සම්බන්ධිත සෙසු සංවිධානය විසින් නිකුත් කරන ලද ඊට සමාන ප්‍රකාශ යාපනයේ දෙමල පුවත් පත්වල පලව තිබූ බවට වාර්තා විය. මක්කල් පඩෙයි සංවිධානයේ නිවේදනය මෙන් ම, මෙම ප්‍රකාශ පිටුපසින් ද තර්ජන හා සැබෑ ප්‍රචන්ඩත්වය පැමිනීම පිලිබඳව සැකයක් ඇති කර ගැනීමට කිසිදු හේතුවක් නැත.

එල්ටීටීඊ-ටීඑන්ඒ නිවේදනයට පසුව, මිලිටරියේ "ආරක්ෂක උත්සුකතාවන්ට" ප්‍රතිචාර ලෙස යාපනයේ බලධාරින් විසින් තව දුරටත් සීමාවන් පැනවීම ගැන නිවේදනයක් පසු ගිය සති අන්තයේ ප්‍රකාශයට පත්

විය. යාපනය දිසාපති කේ. ගනේෂ් සන්ඩේ ටයිම්ස් පත්‍රයට මෙසේ පැවසී යː "යාපන දිස්ත්‍රික්කයේ ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව 624 සිට 220 දක්වා අඩු කර ඇත." මැතිවරනයට තරග කරන සියලු ම පක්ෂ මෙම තීන්දුව අනුමත කර ඇතැයි ද ගනේෂ් කියා පැවේ ය. මේ සම්බන්ධයෙන් සසපයේ අදහස් විමසීමක් කිසි දාක සිදු නො වූ බැවින් මෙම කියා පෑම සාවද්‍ය එකකි.

දෙමල ඡන්දදායකයන්ට හිරිහැර කිරීමේ හා බාධා කිරීමේ මේ සියලු ප්‍රයත්නයන් මධ්‍යයේ, විපාර්ශ්වික එජාපය අනවරත නිශ්ශබ්දතාවක් පවත්වා ගෙන විත් ඇත. පක්ෂය මැතිවරන කොමසාරිස්ගේ කරුනු 10කින් යුත් සැලසුමට එකග ය. මැතිවරනමය වසයෙන් කුමන පාඩු සිදු වුවත්, දෙමල ඡන්ද අවම කිරීමට කොලඹ බලධාරීන් ගනු ලබන ප්‍රයත්නයන් පිටුපසින් පවත්නා වාර්ගික තර්කනයට අභියෝග කිරීමට එජාපය සූදානම් නැත්තේ එය ද එම ස්වෝත්තමවාදී දේශපාලනයේ කර වටක් ගිලී සිටින හෙයිනි.

දෙමල ඡන්දදායකයන්ගේ ඡන්ද බලය අහිමි කිරීමේ සර්ව පාර්ශ්වික ප්‍රයත්නය පිලිබිඹු කරන්නේ සාමාන්‍ය වැඩ කරන ජනයාගේ අයිතීන් සම්බන්ධයෙන් සියලු ම පක්ෂ දක්වන පිලිකුල යි. "සාම ක්‍රියාදාමය" හෝ සෙසු කුමන විධික්‍රම හරහා ඉදිරියට ගෙන ගියත්, ඔවුන්ගේ එල්ලය වන්නේ, කම්කරුවන්ගේ වියදමින් පාලක පන්තියේ විවිධ කන්ඩායම්වල අවශ්‍යතා වෙනුවෙන් ක්‍රියා කිරීම යි. නිලධාරිවාදී සීමාබන්ධනයන්ගෙන් නිදහස්ව සහ මිලිටරිය, එල්ටීටීඊය හෝ වෙනත් ඕනෑම පාර්ශ්වයක ත්‍රස්ත කිරීම්වලින් හා බියගැන්වීම්වලින් තොරව, සිය ඡන්දය පාවිච්චි කිරීමේ මූලික අයිතිය සියලු ඡන්දදායකයන්ට තිබිය යුතු යැයි කිසිදු වැනීමකින් තොරව පැහැදිලිව ප්‍රකාශ කර සිටින එක ම පක්ෂය සසප යි.

© www.wsws.org